**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව**

**පුරප්පාඩු**

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව රජයේ රෝහල් සඳහා අවශ්‍ය ඖෂධ හා ශල්‍ය උපකරණ ආනයනය කරන එකම රාජ්‍ය ආයතනය වන අතර, පුද්ගලික අංශය සඳහා ඖෂධ ආනයනය කර බෙදාහැරීමේ ප්‍රමුඛතම ආයතනය ද වේ.

**<u>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විකුණුම් හා ප්‍රවර්ධන) (HM 1.1)</u>**

**<u>සුදුසුකම්</u>**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අලෙවිතරණය/ වාණිජ්‍යය/ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධිය / විශේෂ උපාධිය **<u>හෝ</u>** එම ක්ෂේත්‍රය ට අදාළ සමාන සුදුසුතමක්

   සහ

   විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අලෙවිකරණය/ වාණිජ්‍යය/ ව්‍යාපාර පරිපාලන ක්ෂේත්‍රය ට අදාළ පශ්චාත් උපාධියක් (Masters) ලබා .තිබීම

   සහ

   රජයේ / සංස්ථා / මණ්ඩල / ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක තළමනාකරණ මට්ටමේ තනතුරක අලෙවිකරණ ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් අවුරුදු 12ක පළපුරුද්ද ලබා තබීම.

**හෝ**

2. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අලෙවිතරණය/ වාණිජ්‍යය/ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක් හෝ විද්‍යාවේදී විශේෂ උපාධියක් **<u>හෝ</u>** එම ක්ෂේත්‍රය ට අදාළ සමාන සුදුසුතමක්

   සහ

   ප්‍රථම උපාධියට පසුව රජයේ / සංස්ථා / මණ්ඩල / ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක තළමනාකරණ මට්ටමේ තනතුරක අලෙවිතරණ ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් අවුරුදු 15ක පළපුරුද්ද ලබා තබීම.

වැටුප් පරිමාණය : රු. 100,370/- 15 × 2,840- 142,970/-

(දළ මාසික වේතනය රු. 213,466/- ක් පමණ වනු ඇත)

වයස් සීමාව : වයස අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

අයදුම්කරුවන්,

i. ශ්‍රී ලාංකීය පුරවැසියෙකු විය යුතුය
ii. තනතුරේ රාජකාරි නිසියාකාරව කිරීමට අවශ්‍ය කායික හා මානසික ශක්තිය තිබිය යුතුය.
iii. සුපිලිපන් චරිතයකින් හෙබි පුද්ගලයෙකු විය යුතුය.

තෝරා ගත් අයදුම්කරුවන් හට මාසික පැමිණීමේ දිරි දීමනාව, ලබා නොගත් නිවාඩු සඳහා මුදල් ප්‍රතිපූර්ණය, වාර්ෂික ප්‍රසාද දීමනා, සමාජයීය ප්‍රතිලාභ, වෛද්‍ය ප්‍රතිලාභ හා සේවකයාට හා පවුලේ අය සඳහා රෝහල්ගත වීමේ වෛද්‍ය රක්ෂණාවරණය සහ රජයේ චක්‍රලේඛනවලට අනුකූල වන පරිදි සංස්ථාව විසින් නඩත්තු කරනු ලබන වාහනයක් සහ මාසික ඉන්ධන දීමනා ඇතුළත්ව ආකර්ශනීය ප්‍රතිලාභ රැසක් හිමි වේ.

අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කළ ජීව දත්ත සමග අයදුම්පතෙහි**,** වයස, සුදුසුකම්, පුහුණුව, සේවා පළපුරුද්ද, වත්මන් තනතුර, වැටුප හා වැටුප් පරිමාණය, දරන ලද පෙර තනතුරු හා පෙර සේවායෝජකයන්ට සම්බන්ධ වූ සහ ඉවත් වූ දිනයන් යන කරුණු ඇතුළත් කොට **ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්, සහතිකවල පිටපත් සහ ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමග යොමු කළ යුතුය.** අදාල **සහතිකවල පිටපත් නොමැතිව යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බව කරුණාවෙන් සලකන්න.**

**අයදුම්පත් බහාලු ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන ලද තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.** රජයේ /රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්, අදාල ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුය. සියළුම අයදුම්පත් **2026.04.06** දිනට හෝ ඊට ප්‍රථම **ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.**

සාමාන්‍යාධිකාරී - වැඩ බලන
ශ්‍රී ලංකා රාජ්‍ය ඔෟෂධ නීතිගත සංස්ථාව,
“මෙහෙවර පියෙස”, 16 වන මහල, නො. 41,
කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථන අංකය 0112 320 356 -9